www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෝක සමාජවාදී වෙබ් අඩවියේ නව සැලසුම සාදරයෙන් පිලිගනිමු

## Welcome the redesigned World Socialist Web Site

**ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති,
ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2008 ඔක්තෝබර් 22**

ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* නව සැලසුමේ ප්‍රථම කලාපය ඔබ වෙත ඉදිරිපත් කරන්නේ සාඩම්බරයෙනි. එය වනාහි වසරකට වැඩි කාලයක් තිස්සේ මෙම ව්‍යාපෘතිය තුල නිමග්න වී ඇති වෙබ් සැලසුම්කරුවන්ගෙන් හා තාක්ෂනඥයන්ගෙන් සමන්විත ජාත්‍යන්තර කන්ඩායමක වැඩකටයුතුවල නිෂ්පාදිතයකි. එය දෘෂ්‍යමයව හා තාක්ෂනිකව ප්‍රධාන ඉදිරි පියවරක් නියෝජනය කරයි. එයි නවීන සැලසුමට අමතරව, පාඨකයන් නිරීක්ෂනය කරනු ඇත්තේ, තමන් වෙබ් අඩවිය තුල සැරිසරන විට එහි ක්‍රියාකාරීත්වය සැලකිය යුතු ආකාරයෙන් වැඩි දියුනු කොට ඇති බව යි.

වෙබ් අඩවියේ නව සැලසුම්කරනය, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* අනන්‍ය ස්වභාවයෙන් ම ගලා එන සැලකිය යුතු අභියෝග මතු කලේ ය. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වනාහි ලොව පුරා සියලු ම වේලා කලාප හරහා වැඩ කරන කැප වුනු සහෝදරවරුන්ගෙන් සමන්විත කාර්ය මන්ඩලයක ප්‍රයත්නයන් එහි දිනපතා නිෂ්පාදනයට සම්බන්ධ වන අව්‍යාජව ම ජාත්‍යන්තර ප්‍රකාශනයකි. වෙබ් අඩවියේ භාෂා 10කට වැඩි සංඛ්‍යාවකින් ලිපි පල කරනු ලැබේ. වෙබ් අඩවියේ පල කර ඇති ලිපි ප්‍රමානය අත්‍යසමාන ය. 1998 පෙබරවාරියේ දී වෙබ් අඩවිය මුලින් ම දියත් කෙරුනු දා පටන්, 25,000කට ආසන්න ලිපි ප්‍රමානයක් පල කරනු ලැබ ඇත. මෙම සංඛ්‍යාව වඩා සිත් කාවදින එකක් බවට පත් කෙරෙන්නේ, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* විසින් ඉදිරිපත් කරනු ලබන ලිපිවල විෂය පරාසය සහ ගැඹුර මගිනි.

හුදෙක් අපගේ වෙබ් අඩවියේ පල වී ඇති ප්‍රවෘත්ති ලිපිවල පදනම මත වුවත්, පසුගිය දශකයේ ප්‍රධාන ජාත්‍යන්තර සිද්ධීන්ගේ බෙහෙවින් සවිස්තර පින්තූරයක් ප්‍රතිනිෂ්පාදනය කර ගත හැකි වනු ඇත. දේශපාලන හා ආර්ථික වර්ධනයන් පිලිබඳ ආවරනයට අමතරව, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, සමාජ ප්‍රශ්න, කලාත්මක නිර්මානයේ හා සෞන්දර්ය න්‍යායේ ගැටලු, විද්‍යාවේ වර්ධනයන්, මතභේදයට ලක්ව ඇති ඓතිහාසික කරුනු සහ දර්ශනවාදාත්මක මතභේද අවධානයෙන් අධ්‍යයනය කොට ඒවා පිලිබඳව අදහස් දක්වා තිබේ. පසුගිය 10 වසරේ දැවැන්ත නිෂ්පාදිතයට *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පාඨකයන්ට දිගට ම ප්‍රවිෂ්ට විය හැකි ය (සූක්ෂ්ම සෙවුම් යන්ත්‍රයක් භාවිතයෙන්).

නව සැලසුම්කරනයට සම්බන්ධිත බොහෝ තාක්ෂනික හා සෞන්දර්ය ගැටලුවල වැදගත්කම හා සංකීර්න භාවය කෙසේ වෙතත්, ව්‍යාපෘතියට මග පෙන්වූ ප්‍රධාන උත්සුකතා දේශපාලනික විය. නව සැලසුම්කරනය සිදු කෙරුනේ, ශීඝ්‍රයෙන් වැඩෙන පාඨකත්වය විසින් මතු කෙරුනු ඉල්ලීම්වලට ප්‍රතිචාර වසයෙන් සහ ලෝක දේශපාලන හා ආර්ථික තත්වයේ ප්‍රධාන වෙනස්කම් පෙරදකිමිනි.

මෑත සතිවල හටගත් කලබගෑනි සහගත සිද්ධීන්වල ආලෝකයෙන් ගත් කල, නව සැලසුම දියත් කල අවස්ථාව නිර්නය කිරීම, විශේෂයෙන් ම අහම්බයක් ලෙස පෙනී යා හැකි ය. එහෙත් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* අවධානයෙන් කියවන පාඨකයන් නිසැකව ම දන්වා පරිදි, අපි වඩ වඩා අස්ථායි වන ලෝක ධනපති ක්‍රමයේ දිගහැරෙන ප්‍රතිවිරෝධතා ක්‍රමනුකූලව අධ්‍යයනය කොට ඇත්තෙමු. වත්මන් අර්බුදයේ පිපිරීම *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පුදුමයට පත් කලේ නැත.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* දේශපාලන දිශාවනතිය සහ කර්තව්‍යයන් ගලා එන්නේ, දිගහැරෙන අර්බුදයේ වෛෂයික ඇඟවුම් පිලිබඳ තක්සේරුවකිනි. කෙටියෙන් සඳහන් කල හොත්, ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය පහත දැක්වෙන කරුනු අවධාරනය කර සිටිː

1. එක්සත් ජනපදය තුල කේන්ද්‍රගත වී ඇති ගෝලීය මූල්‍ය අර්බුදය ලෝක ධනපති ක්‍රමයේ ඓතිහාසික අර්බුදයේ තීරනාත්මක හැරුම් ලක්ෂ්‍යයක් සලකුනු කරයි. ධනපති නිෂ්පාදන විධි ක්‍රමයේ ආවේනික හා සමහන් කල නොහැකි ප්‍රතිවිරෝධතා පිලිබඳ මාක්ස්වාදී විශ්ලේෂනය සිත් කාවදින ලෙස සනාථ වී තිබේ.

2. ගැඹුරු වන ආර්ථික අර්බුදය ප්‍රධාන අධිරාජ්‍යවාදී හා ධනවාදී බලවතුන් අතර දැනට මත් සැලකිය යුතු මට්ටමකට වර්ධනය වී ඇති ආතතීන් උත්සන්න කරනු ඇත. නිෂ්පාදන බලවේගයන්ගේ ජාත්‍යන්තරව ඒකාග්‍රිත වර්ධනයත් ජාතික රාජ්‍ය පද්ධතියත් අතර පවත්නා මූලික ඓතිහාසික ගැටුම ගෝලීය යුද ගිනිමැලයක තර්ජනය වඩාත් විවෘතව මතු කරනු ඇත. සිය ලෝක ආර්ථික තත්වයේ පරිහානිය ආපසු හරවා ගනු වස් එක්සත් ජනපදය දරන ප්‍රයත්නයෝ, දැන් වැඩෙන අර්බුදය තුල නාටකාකාර ලෙස එලිමහනට පැමින ඇති අතර, වඩ වඩා ඉවබවක් නැති හා අබාධිත මිලිටරිවාදී ස්වභාවයක් අත්පත් කරගනු ඇත.

3. වඩ වඩා නරක අතට හැරෙන ආර්ථික තත්වය ලෝක පරිමානයකින් පන්ති අරගලයේ නව නැගිටීමකට නොවැලැක්විය හැකි ලෙස ම තුඩු දෙයි. සිය අරගල වලකාලීමට හා පාවා දීමට පැරනි හා දූෂිත නිලධරවාදී සංවිධාන -- දේශපාලන පක්ෂ සහ වෘත්තීය සමිති -- දරන ප්‍රයත්නයන්ට කම්කරු පන්තිය වැඩෙන අධිෂ්ඨානයකින් යුක්තව ප්‍රතිරෝධය දක්වනු ඇත.

4. අලුතෙන් රැඩිකලීකරනය වූ කම්කරුවන්, ශිෂ්‍යයන්, තරුනයන් හා බුද්ධිමතුන් අතර හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ඉදිරිපත් කරන විප්ලවවාදී සමාජවාදයේ ඉදිරිදර්ශනය හා ක්‍රියාමාර්ගයට ද මාක්ස්වාදී න්‍යායට ද නව ශ්‍රාවකත්වයක් විවෘත වනු ඇත. මාක්ස්වාදී න්‍යාය මත දෘඩතරව පදනම් වන හා ට්‍රොට්ස්කිවාදයේ උරුමය නොපැකිලව ආරක්ෂා කරන පක්ෂයක් ම පමනක් නව විප්ලවවාදී යුගයක අභියෝගයන්ට මුහුන දීමට සමත් වනු ඇත.

වර්ධනය වන අර්බුදය පිලිබඳ මෙම තක්සේරුව මත පදනම්ව, ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* අලුතෙන් සැලසුම් කිරීම හා අලුතෙන් දියත් කිරීම, කම්කරු බලය හා සමාජවාදය ගොඩනැගීම සඳහා වූ අරගලය තුල ප්‍රධාන ඉදිරි පියවරක් ලෙස දකී.

© www.wsws.org